# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

### මානව ශාස්ත්‍ර පීඨය

### බෞද්ධ සංස්කෘතිය - BUCU - E 3025
### සමයාන්තර චින්තා සහ බුදු දහම, ථෙරවාද හා මහායාන සම්ප්‍රදාය

**එක් කොටසකින් යටත් පිරිසෙන් ප්‍රශ්න දෙකක් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ආගම පිළිබඳ විද්වත් මතවලට සාපේක්ෂව බුදුදහමේ සුවිශේෂිතා ඉදිරිපත් කරන්න.

02. "මිනිසා සහ පරිසරය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය වෛදික දේව සංකල්පයෙන් පිළිබිඹු වේ." අදහස් දක්වන්න.

03. කිතු දහමේ දැක්වෙන දස පනත සමග බොදුනුවන්ගේ පඤ්චශීල ප්‍රතිපදාව තුලනය කරන්න.

04. අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් අනාවරණය කරන ලද පඤ්චවිධ ආගමික ප්‍රතිපත්තියෙහි සමාජ උපයෝගීතාව ගෙනහැර දක්වන්න.

05. සමාජ ප්‍රභවය සහ විකාශය පිළිබඳ දේව නිර්මාණවාදී ආගමික සංකල්ප බෞද්ධ චින්තනයෙන් ප්‍රතික්ෂේප කිරීමේ යුක්තිය ප්‍රකට කරන්න.

## II කොටස

06. ථෙරවාද සහ මහායාන යන පදවලට අනුගතව එම සම්ප්‍රදායයන්හි අනන්‍යතාව ඉදිරිපත් කරන්න.

07. ථෙරීය නිකාය පැරණිතම බෞද්ධ ගුරුකුලය ලෙස සැලකීමේ යුක්තිය ප්‍රකට කරන්න.

08. මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ආරම්භය පිණිස සමකාලීන ආගමික සහ සාමාජික පසුබිම බලපෑ අයුරු පෙන්වා දෙන්න.

09. බුද්ධ සංකල්පය පාලි හා සංස්කෘත මූලාශ්‍රය ඇසුරින් සංවර්ධනය වූ අයුරු අදාළ මූලාශ්‍රය පදනම් කරගෙන ඉදිරිපත් කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතරින් **දෙකකට** ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. ධම්මපදපාළිය ii. භගවත්ගීතාව iii. ශුද්ධවූ බයිබලය iv. අල් කුරාණය

******************